**මන්මුනේ දකුණ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාව - 2017**
**මඩකලපුව දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 14 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 13 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මන්මුනේ දකුණ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහපොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට පෙර 2016 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු හිඟ රු.17,595,800 ක් වුවත්, රු.4,600,000 ක් පමණක් ආරම්භක හිඟ ශේෂය වශයෙන් දක්වා තිබුණි. මේ නිසා අවසන් හිඟය රු.12,995,800 කින් අවසන් ප්‍රකාශනවල අඩුවෙන් ඉදිරිපත් කර තිබුණි.

(ආ) UNOPS ආයතනයෙන් 2017 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු අංක KE 8126 දරන මොන්ටේරෝ රථය සහ යතුරු පැදියේ වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.3.2 ලැබිය යුතු ගිණුම්

1987 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාල විදුලි වියදම් රු. 1,656,338ක් අයකර ගැනීමට හෝ ලේඛනවලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

#### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| **විෂයයන්** | **වටිනාකම** | **ඉදිරිපත් නොකළ සාක්ෂි** |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 154,758,806 | ඉඩම් ඔප්පු |
| යන්ත්‍රෝපකරණ | 2,151,123 | ස්ථාවර වත්කම් ලේඛනය |
| මෝටර් රථ හා කරත්ත | 13,147,424 | |

### 1.3.4 නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ) 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති** | |
| (i) I පරිච්ඡේදයේ 5(XII) වගන්තිය | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් තැබීම් ආදිය සඳහා සම්බන්ධිත නිලධාරීන් දෙදෙනෙකුගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතිබුණි. |
| (ii) X පරිච්ඡේදයේ 193 වගන්තිය | වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය ඇස්තමේන්තුව සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ)** 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග ආදිය ලේඛනගත කිරීම සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.10,691,626 කි. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 15,595,655 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,904,029 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

**2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

---------------------------------------

සභාව විසින් පවත්වාගෙන යනු ලබන මුදල් පොත ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ එක් එක් මාසය අවසානයේ රු.මිලියන 22 ක සිට රු.මිලියන 29 දක්වා වන පරාසයක මුදල් ශේෂයක් දක්නට ලැබුණි. මෙය ඵලදායි තැන්පතුවල ආයෝජනය කර ආදායමක් ලබාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් සභාව වාර්ෂිකව ආසන්න වශයෙන් රු.මිලියන 2.2 ක පොලී ආදායමක් අහිමි කරමින් තිබුණි.

**2.3 ආදායම් කළමනාකරණය**

------------------------------

**2.3.1 ඇස්තමේන්තු කළ ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්**

------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට හිඟ හිටව පැවති රු. 561,086 ක වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයේ අයකර ගත යුතු බදු කුලී ආදායම් රු.2,600,509ක්ව පැවතුණද, සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. 4,717,005ක් වශයෙන් වැඩිවී තිබීම බදු අයකර ගැනීමේ පසුබැසීමක් නිරීක්ෂණය කෙරුණි.

**2.3.2 අනෙකුත් ආදායම්**

-------------------

2017 දෙසැම්බර් 31 දිනට හිඟ හිටව පැවැති රු.699,625 ක වෙළඳපොල කඩකුලී හා රු.4,047,379 ක බදු කුලීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්යසාධනය**

----------------

**තිරසාර සංවර්ධන අරමුණු**

--------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ළඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාරයක්ෂමතා**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේදී UNDP ආයතනයෙන් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ අයිතිය සභාවේ නමට මාරු කරගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, මෙම යන්ත්‍රය ලැබී තිබූ කාල පරිච්ඡේදයේ සිට මේ දක්වා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පැවති වාහන 31 ක් සහ යන්ත්‍රවලින් වර්ග 17 කට වාහන බලපත්‍ර නොවූ අතර ඒවා ලබාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගද ගෙන නොතිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශයේ මස් කඩ පනත අනුව ඝාතනය කරනු ලබන එළුවන් පැය 24 කට නොඅඩු කාලයකදී ඝාතකාගාරයේ තැබීමට පටහැනිව මෙන්ම සමාලෝචිත වර්ෂයේ සෞඛ්‍ය පරීක්ෂණ සම්බන්ධ මෙහෙයුම්වලින් තොරව ඝාතනය කිරීමට ඇති අවස්ථා වැඩි වී තිබූ බව දක්නට ලැබුණි. මේ නිසා, සෞඛ්‍යයට අහිතකර එළුවන්ද ඝාතනය කිරීමට ඇති අවස්ථා දක්නට ලැබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අතැති මුදල් ශේෂය සාමාන්‍යයෙන් රු.මිලියන 22 ක් වුවත්, සභාව විසින් රු.මිලියන 9.5 කට JCB යන්ත්‍රය මිලදී ගැනීම සඳහා පළාත් පාලන සංවර්ධන ණය අරමුදල හරහා ණය ලබාගැනීම වෙනුවෙන් මාස 60 ක් සඳහා එකතුව රු.2,258,612 ක් ණය පොලී පමණක් ගෙවිය යුතුව තිබුණි. සභාව සතුව ප්‍රමාණවත් අරමුදල් තිබූ නමුත් එමගින් මිලදී ගැනීම සිදු කළේ නම්, පොලී ගෙවීම සභාවට නවතා ගත හැකිව තිබුණි.

### 3.3 මව්, ළදරු සුභසාධනය සහ සෞභාග්‍යය පවත්වා ගැනීම

2017 වර්ෂයේ මඩකලපුව සෞඛ්‍ය සේවා ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයාගේ සංඛ්‍යා ලේඛන අනුව සභා බල ප්‍රදේශය තුළ ඉපදුණු ළදරුවන් 1,079 කගෙන් ළදරුවන් 113 (10.5%) අඩු බර දරුවන් ලෙස ඉපදී තිබුණි. එසේ වුවත්, සභාව විසින් අයවැය ඇස්තමේන්තුවේ රු.500,000 ක ප්‍රතිපාදන මව් ළදරු සුභසාධනය වෙනුවෙන් සලසා තිබුණත්, රු.343,500 ක් පමණක් ඉහත සඳහන් වැඩසටහන සඳහා වැයකර තිබුණි. තවද, 2014, 2015 සහ 2016 වර්ෂවලදී පිළිවෙලින් අඩු බර ළදරුවන් 104, 80, 105 ක් ඉපදී තිබුණත්, සභාව විසින් ඉහත වර්ෂවලදී මෙම කරුණ සඳහා ප්‍රතිපාදන සලසා වැය කර තිබූ නමුත්, ප්‍රමාණවත් ප්රතිපාදන වෙන්කර නොතිබුණි.

### 3.4 වාහන භාවිතය

සභාවේ වර්ෂ කිහිපයක සිට වාහන 03 ක් අක්‍රීය වී භාවිතයට නොගෙන තිබූ නමුත් ඒවා අළුත්වැඩියා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 3.5 ප්‍රසම්පාදනය

#### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂයේ ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රු.865,275 ක් වැය කර තිබුණත්, නිවැරදිව මිලදී ගැනීමේ සැලැස්ම සකස් නොකර අවශ්‍යතාවයට අධිකව මිලදී ගෙන සභාවේ ගොඩ ගසා තිබූ බව නිරීක්ෂණය විය.

### 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

#### මාර්ගවලට බොරළු දැමීම

2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛයේ 1.2 ඡේදය ප්‍රකාරව, මූලධන ප්‍රතිපාදන යටතේ සංවර්ධන සැලැසුම් ක්‍රියාත්මක කර පළාත් පාලන සභා මාර්ග ඉදිකිරීමේදී බොරළු යෙදීම නවතා දිගු කාලයක් භාවිතා කළ හැකි ආකාරයෙන් කාපට් දැමීම, තාර දැමීම සහ

කොන්ක්‍රීට් දැමීම ආදිය සිදුකළ යුතු බවට දක්වා ඇති නමුත් එයට පටහැනිව කටයුතු කරමින් සමාලෝචිත වර්ෂයේ සභාව විසින් මාර්ග 08 කට එකතුව රු.3,057,594 ක බොරළු දමා තිබුණි.

## 4. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| **පාලන ක්ෂේත්‍රය** | **විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන්** |
|---|---|
| (අ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) අයවැය පාලනය | අයවැය පිළියෙල කිරීමේදී පසුගිය වර්ෂවල තථ්‍ය වියදම් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම.<br>(ii) සභාවේ භාවිතා නොකර නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් භාවිතා කිරීමට පියවර ගැනීම. |